All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

07 ශ්‍රේණිය

# චිත්‍ර කලාව

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

## I කොටස

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



01 පොළොන්නරුවේ දී අපට හමුවන මෙය ........................................................................ වෙහෙර නමින් හැඳින්වේ.

02 මෙම දාගැබ ........................................................................ රජු විසින් කරවන ලද බව සැලකේ.

03 දාගැබෙහි හතරැස් කොටුවේ සෑම මුහුණතකම අටපෙති ........................................................ මල් දක්වා තිබීම අනෙකුත් ස්ථූපවල නොමැති විශේෂයකි.

04 චෛත්‍යයේ සතර දිසාවන්ට මුහුණලා අලංකාර මල් ලියකම් වලින් යුතු ............................................ සතරකි.

05 ධාතු ගර්භයේ මූලික හැඩය අනුව මෙය ................................ හැඩයෙන් යුක්ත වූ දාගැබකි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.

06 උතුරු නැගෙනහිර පළාත් මූලික කරගෙන බහුලව ව්‍යාප්ත වූ කර්මාන්තයකි.

(1) තල කොළ (2) පිත්තල (3) ලාක්ෂා (4) වෙස්මුහුණු

07 නියඳ කළාල හෙවත් නියඳ පැදුරු ප්‍රධාන කොටස් 3 ට අයත් නොවන්නේ මින් කුමක් ද?

(1) පන්නම් කළාල (2) කුරුළු කළාල (3) වැඩ කළාල (4) හැඩ කළාල

08 ලක්දිව ඉදිකළ පළමු ස්තූපය ලෙස හඳුන්වන්නේ,

(1) කැලණි විහාරයයි. (2) ථූපාරාම විහාරයයි. (3) අභයගිරි විහාරයයි. (4) ජේතවන විහාරයයි.

09 ජන කලාවක් ලෙස ශ්‍රී ලංකාවේ පාරම්පරිකව පැවත එන රූකඩ වර්ගය

(1) අත් රූකඩ වේ. (2) රිටි රූකඩ වේ. (3) නූල් රූකඩ වේ. (4) සෙවනැලි රූකඩ වේ.

10 වාටියක් හෝ අයිනක් සැරසිලි කිරීම සඳහා බහුල වශයෙන් මෙම සැරසිල්ල යොදාගෙන ඇත.

(1) පිච්ච මල (2) පලාපෙති (3) සපුමල (4) සීනමල

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වාක්‍ය හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වාක්‍ය ඉදිරියේ ඇති වරහන් තුළ සටහන් කරන්න.

11 සංඛ නිධි සහ පද්ම නිධි සහිත මුරගල් ථූපාරාම විහාරය අසලින් හමුවේ. ( )

12 අතීතයේ චිත්‍ර ශිල්පීන් මකුළු මැටි යොදාගනිමින් සුදු වර්ණය සාදාගෙන ඇත. ( )

13 ටෙම්ප්ලේට් ක්‍රමයට මෝස්තරයක් කිරීමේ දී ඒ සඳහා වර්ණ මාධ්‍ය ලෙස දිය සායම් යොදාගැනීම සුදුසුවේ. ( )

14 දාගැබ් අංගයක් වන වටදාගෙය ථූපඝරය යන නමින් ද හඳුන්වයි. ( )

15 පන් පැදුරු වර්ණ ගැන්වීමේ දී පතගි දුව උපයෝගී කරගෙන කොළ වර්ණය සාදාගනී. ( )

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා හිස්තැනට යොදන්න.

(කාටූන් / නෙලුම් / කුට්ටාන් / කැටයම් / කඩුපුල්)

16 ....................................... නිර්මාණය කිරීමේ දී අවශ්‍ය හැඩ මතුකර ගැනීම සඳහා අනවශ්‍ය කොටස් කපා ඉවත් කරනු ලබයි.

17 තල්කොළ වලින් කරන ලද බහාලුම් උපකරණයක් වෙළඳපොලේදී අපට හමුවේ. එය ....................................... නමින් හඳුන්වනු ලැබේ.

18 පාලි භාෂාවෙන් "කුමුදුප්පල" ලෙසද සිංහල භාෂාවෙන් "දිව මහනෙල්" යන නමින් ද හඳුන්වන ............................................................ මල නා ලොවට අයත් මලක් යැයි සැලකේ.

19 වෘත්තාකාර ආකෘතියක් තුළ විවිධාකාර හැඩයෙන් යුත් ................................................ මල් නිර්මාණ රාශියක් විහාර සිවිලිම් සැරසිලිවල දැකිය හැක.

20 අප අවට පරිසරයේ ඇති සියලුම ස්වභාවික හා නිර්මිත වස්තු ............................................. නිර්මාණවලදී සජීවී චරිත ලෙස ඉදිරිපත් කර ඇත. (ලකුණු 2 x 20 = 40)

## II කොටස

- ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.
- දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් අඳින්න.
- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.

01 ශ්‍රමදානයක යෙදෙන මිනිසුන් සහ ගැහැණුන් පිරිසක්

02 ඇලක, ගඟක, ඔයක දිය නාන මිතුරන් පිරිසක්

03 පන්සලක, පල්ලියක, දේවස්ථානයක, කෝවිලක පැවැත්වෙන ආගමික උත්සවයක්

04 මල්, කොළ, පොහොට්ටු ආදිය රටාවකට යොදාගනිමින් ව්‍යාප්ත මෝස්තරයක් අඳින්න.

05 මේස රෙද්දකට ගැලපෙන මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

06 පාසලේ වාර්ෂිකව පැවැත්වෙන විවිධ ප්‍රසංගයක් සඳහා දැන්වීමක් නිර්මාණය කරන්න. (ලකුණු 60 යි)